ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.05.12

01. ආර්.ආර්. කාංචන සාලිය රත්නායක
02. ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක
    අංක B/58/3, වෙන්දේසිවත්ත,
    යටිටෝගොඩ.

**පැමිණිලිකාර පාර්ශවය**

පැමිණිලි අංකය : **HRC/KND/351/23 - I**

01. පී.එන්.බී. මාගෙදරගම
    මූලස්ථාන පොලිස් පරීක්ෂක,
    පොලිස් ස්ථානය, කෑගල්ල.
02. ආර්.කේ. රූපසිංහ,
    පොලිස් පරීක්ෂක,
    ස්ථානාධිපති,
    අපරාධ විමර්ශන අංශය,
    පොලිස් ස්ථානය, කෑගල්ල.
03. පො.කො. 10419 රෝහණ
    පොලිස් ස්ථානය, කෑගල්ල.
04. පො.සැ. 59561 බණ්ඩාර
    පොලිස් ස්ථානය, කෑගල්ල.
05. පො.කො. 84239 ප්‍රේමසිරි
    පොලිස් ස්ථානය, කෑගල්ල.
06. පො.කො.85049 හේමචන්ද්‍ර
    පොලිස් ස්ථානය, කෑගල්ල.
    (වර්තමාන සේවා ස්ථානය: පොලිස් ස්ථානය, කඩුගන්නාව)
07. පො.සැ.රි. 34544 අබේරත්න
    පොලිස් ස්ථානය, කෑගල්ල.
08. පො.කො.රි. 80972 සෝමරත්න
    පොලිස් ස්ථානය, කෑගල්ල.
09. පො.සැ. 64324 සම්පත්
    පොලිස් ස්ථානය, කෑගල්ල.

**වගඋත්තරකාර පාර්ශවය**


ධාන කාර්යාලය / ரதான அலுவலகம் / ead Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.

සභාපති / தவிசாளர் / Chairman: 011-2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com

්කථන / தாலைபேசி / :lephone: 94-11-2505580 / 81 / 82

ලේකම් / செயலாளர் / Secretary: 011-2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරුවන් වන ආර්.ආර්. කාංචන සාලිය රත්නායක සහ ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයවලුන් විසින් 2023.07.17 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇත. එකී පැමිණිල්ලට අනුව 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක සහ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයවලුන් එකම පවුලේ සොහොයුරන් වන බවත්, 2023.06.25 වන දින රාත්‍රී 7.45ට පමණ ඔවුන්ගේ නිවසෙහි පිටුපස දොර තල්ලු කරගෙන කෑගල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඇතුලු පොලිස් නිලධාරීන් කණ්ඩායමක් නිවසට ඇතුලු වූ බවත්, නිවසේ සිටි කිසිම අයෙකුගෙන් කිසිවක් නොවිමසා 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන තමා හට එම නිලධාරීන් පහර දුන් බවත්, බෙල්ල තද කරගෙන අතින් පයින් පහර දුන් බවත්, තමාට පහර දෙන්නේ කුමන වරදකට ද තමාට ඇති පැමිණිල්ල හෝ චෝදනාව කුමක් දැයි දිගින් දිගටම ඇසුවත් එම නිලධාරීන් කිසිවක් නොපවසා තමා ඇඳ සිටි කමිසය ඉරා විසිකර කලිසමෙන් ද ඇද ඉරමින් තමා හට තම නිවස තුළ දීම දැඩි ලෙස පහර දුන් බවත් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, එම අවස්ථාවේදී 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය විසින් පොලිස් නිලධාරීන් තම සොහොයුරා වූ 1 වන පැමිණිලිකරුට පහරදෙනු දැක "ඇයි මගේ අයියාට ගහන්නේ" යැයි ඇසූ බවත්, එවිට කිසිදු හේතුවක් නොදක්වා තමාට ද පහරදුන් බවත් 2 වන පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය විසින් තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තම අත් පා ඇද අඹරා බිම දමා එළියේ මිදුලට ඇදගෙන ගොස් එහිදී ද පහර දී තමාගේ අතට මාංචු දමා තවදුරටත් පහර දී පොලිස් නිලධාරීන් පිරිස තමා සහ තම සොහොයුරා වන 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයව බලහත්කාරයෙන් පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් ය.

එලෙස යන අතරතුරදී සහ පොලිස් ස්ථානය තුළ දී ද තමාවත් තම සහෝදරයාවත් රෝහලට රැගෙන යන ලෙස කෑගසමින් ඉල්ලා සිටිය ද පසුදින දහවල් 1.30ට පමණ වනතෙක්ම රෝහල් ගත නොකළ බවත්, එලෙස පහරදීමට තමා හෝ තම සහෝදරයා කිසිදු වරදක් කර නොමැති අතර බොරු චෝදනාවක් ගොනු කර තමා සහ තම සහෝදරයාව අධිකරණයට ඉදිරිපත් කර බන්ධනාගාර ගත කරන ලද බවත්, එලෙස අධිකරණයට ඉදිරිපත් කරන තුරුම තමාවත් තම සහෝදරයාවත් තමන්ට එරෙහිව ඇති චෝදනාව නොදැන සිටි බවත්, පොලිස් ස්ථානයේ රඳවාගෙන සිටි කාලයේ දී නීතිඥ සහයක් ලබා ගැනීමට හෝ අවස්ථාවක් නොදුන් බවත්, තම දුරකතන ද පොලිස් භාරයට ගත් බවත් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය විසින් ප්‍රකාශ කර ඇත.

<u>**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**</u>

<u>**1 වන වගඋත්තරකාර පු.පො.ප. පී.එන්.බී. මාගෙදරගම යන අයගේ කරුණු දැක්වීම**</u>

1 වන වගඋත්තරකාර පු.පො.ප. පී.එන්.බී. මාගෙදරගම යන අය විසින් 2025.01.16 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

"මම 2023.01.19 වන දින සිට කෑගල්ල පොලිස් ස්ථානයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලෙස සේවය කරනවා. 2023.03.20 වන දින MOR 192/23 යටතේ කෑගල්ල පොලිස් ස්ථානයට ගලිගමුව, බල්ලපාන නිල්මිණී හෝටලේ හිමිකාර රුක්මන් වනිගසේකර නැමැත්තා විසින් ඔහුට වානක නැමැති අය විසින් පහර දී ගෙල බැදි රන්මාලය කඩාගත් බවට කරන ලද පැමිණිල්ල විමර්ශනය කළ ද සැකකරු අත්අඩංගුවට ගැනීමට නොහැකි විය. ඉන් අනතුරුව 2023.06.25 වන දින මා ඇතුලු නිලධාරීන් කිහිප දෙනෙකු ඉහත කී වානක නැමැති අයගේ නිවසට ගොස් ඔහුව අත්අඩංගුවට ගැනීමට උත්සහ කිරීමේදී කලහකාරී ලෙස හැසිරීම නිසා අප විසින් අවම බලය භාවිත කොට ඔහුව අල්ලාගත්තා. එම අවස්ථාවේ වානක නැමැති අය ඇතුලු කිහිප දෙනෙකු නිවසේ සිටි අතර ඔවුන් මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමට ඉඩ නොදුන් නිසා බලය පාවිච්චි කිරීමේ දී පිරිස පරුෂ වචනයෙන් බැන වැදී සැකකරු මුදා ගැනීමට උත්සහ කිරීමේ දී ඔවුන් විසින් පොලිස් නිලධාරීන්ටද පහර දුන්නා. මෙම අවස්ථාවේදී අප විසින් බලවත් උත්සහයක් යොදා සැකකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ආවා. එම අවස්ථාවේදී සැකකරුගේ සහෝදරයෙක් එතනට පැමිණ පරුෂ වචනයෙන් බැන වැද පහර දුන්නා. පොලිස් නිලධාරීන්ට තුවාල සිදු වුණා. අප විසින් සිද්ධිය වීඩියෝ ගත කළා. සැකකරුවන් ද සිද්ධිය වීඩියෝ ගත කළා. එම වීඩියෝ පටය අපට කොමිෂන් සභාවට ඉදිරිපත් කළ හැකියි. සැකකරු පොලිස් ස්ථානයට රැගෙන ආ පසු ඔහුගේ සහෝදරයා ත්‍රීරෝද රථයෙන් පොලිස් ස්ථානයට පැමිණ "තොපි අසාධාරණ ලෙස මගේ අයියාව අත්අඩංගුවට ගත්තා. තොපි හෝටල්කාරයොන්ගෙන් ජරාව කාළා. මාවත් ඇතුළට දාපන්" යනුවෙන් පවසා රාජකාරියට බාධා කළා. ඔහුගේ නම උදාර රත්නායක වන අතර ඔහුව අත්අඩංගුවට ගෙන පසුදා කෑගල්ල අධිකරණයට ඉදිරිපත් කළා. මෙම අයවලුන්ට මා හෝ මාගේ නිලධාරීන් පහරදීමක් සිදු කළ නෑ. අත්අඩංගුවට ගන්න යන විට සියලු දෙනා ප්‍රතිවිරෝධය දැක්වීම නිසා පොරබැදීමක් සිදු වුණා. මෙම පොරබදින අවස්ථාවේදී එක පොදියට සියලු දෙනා බිම වැටුණා. එම අවස්ථාවේදී සීරීම් හෝ තුවාල ඇති වෙන්න ඇති. හිතාමතා පහරදීමක් කළේ නෑ. එම අවස්ථාවේ ඔවුන් ද වීඩියෝ කළා. අප පහර දුන්නා නම් සාක්ෂි විදියට ඒවා ඉදිරිපත් කරන්නත් පුළුවන්."

<u>**2 වන වගඋත්තරකාර පො.ප. ආර්.කේ. රූපසිංහ යන අයගේ කරුණු දැක්වීම**</u>

2 වන වගඋත්තරකාර පො.ප. ආර්.කේ. රූපසිංහ යන අය විසින් 2025.01.16 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

“මා කෑගල්ල පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ලෙස 2023.01.06 වන දින සිට රාජකාරි කරනවා. රන්මාලයක් කැඩීමක් හා පහර දීමක් සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ලකට අදාළ සැකකරුවන්ව අත්අඩංගුවට ගැනීම සඳහා කෑගල්ල යට්ටෝගොඩ ප්‍රදේශයට මූලස්ථාන පොලිස් පරීක්ෂක මාගෙදරගම මහතා හා තවත් නිලධාරීන් කණ්ඩායමක් සමඟ 2023.06.25 වන දින පැය 18.45ට පමණ පොලිස් ස්ථානයෙන් පිටත් වුණා. මා එම ස්ථානයට සම්බන්ධ වූයේ එදින මා අපරාධ වැළැක්වීමේ සංචාරක රාජකාරී වල පො.සැ.64324 සම්පත් නිලධාරියා සමඟ පො.කො.85049 හේමචන්ද්‍ර පදවන ලද ABV-1953 ත්‍රීරෝද රථයෙන් සංචාරක රාජකාරයේ යෙදී සිටි අතර මා හට මූ.පො.ප. කරන ලද දැනුම් දීම අනුව ය. අප ගල්ගමුව හන්දියට පැමිණි අතර මූ.පො.ප. තුමා පො.කො.රි. 10505 දිල්ශාන් නිලධාරියා විසින් පදවනු ලැබූ රථයෙන් නිලධාරීන් කණ්ඩායමක් සමඟ එම ස්ථානයට ගියා. එම රථයේ පො.කො.10419 රෝහණ යන නිලධාරියාද සිටි අතර රාත්‍රී ජංගම රාජකාරී යෙදී සිටි පො.සැ. 59561 බණ්ඩාර, පො.කො. 84239 ප්‍රේමසිරි, පො.කො.80972 සෝමරත්න යන නිලධාරීන් පො.සැ.රි.34554 අභයරත්න පදවන ලද ABV-0865 රථයේ එම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ වුණා. පසුව අප නිලධාරීන් කණ්ඩායම මෙම අපරාධය සම්බන්ධයෙන් සැකකරු අත්අඩංගුවට ගැනීමට සැකකරුගේ නිවසට ගිය අතර එම නිවසේ පුද්ගලයන් කිහිප දෙනෙකු සිටි බව දැක ගැනීමට හැකිවුණා. ඒ අවස්ථාවේදී සැකකරු අත්අඩංගුවට ගැනීමට යන විට නිවස පිටු පසින් පැමිණි පුද්ගලයින් “තොපි ඒ පාර පොලිසියේ සේරම අරන් ආවාද මාව ගෙනියන්න පොලිසියේ පකයලා” කියා අපට බැණ වැදුනා. එම අවස්ථාවේ නිවස තුළ සිටි තවත් පුද්ගලයින් කිහිප දෙනෙකු පැමිණ සැකකරු අත්අඩංගුවට ගැනීමට බාධා සිදු කළ අතර ඔවුන් ද පරුෂ වචනයෙන් බැන වැදුනා. අප විසින් සැකකරු අත්අඩංගුවට ගැනීමට අවම බලය යෙදුවා. මෙම අවස්ථාවේදී ඔවුන් විසින් විරෝධතාවය දැක්වීම නිසා දෙපාර්ශවය බිම ඇද වැටුණා. මේ නිසා තුවාල හෝ සීරීම් තුවාල ඇතිවන්නට ඇත. අප ඔවුන්ට පහරදීමක් කිසිදු අවස්ථාවක සිදු කළේ නැත.”

<u>3 වන වගඋත්තරකාර පො.කො.10419 රෝහණ යන අයගේ කරුණු දැක්වීම</u>

3 වන වගඋත්තරකාර පො.කො.10419 රෝහණ යන අය විසින් 2025.11.14 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

“මා 2022.04.05 වන දින සිට කෑගල්ල පොලිස් ස්ථානයට අනුයුක්තව සේවයේ යෙදී සිටිනවා. 2023.06.25 වන දින මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකතුමා සමඟ පො.කො.රි.105505 දිල්ශාන් සමඟ ජීප් රථයෙන් සංචාරයේ යෙදී සිටි අවස්ථාවේ දී මොබයිල් රාජකාරියේ යෙදී සිටි පො.සැ. 59561 බණ්ඩාර මූ.පො.ප.තුමාට කෝල් කරලා කිව්වා යට්ටෝගොඩ සැකකරු අත්අඩංගුවට ගන්න ගියා. නමුත් ඔහු කලහකාරි ලෙස හැසිරෙන නිසා අත්අඩංගුවට ගන්න අපහසුයි කියලා. ඉන්පසු අප තිදෙනාම එම ගලිගමුව නගරයේ රාත්‍රී රාජකාරියේ මුර සංචාරයේ යෙදී සිටි පොලිස් පරීක්ෂක පුෂ්පකුමාර මහතා සහ පො.කො.රි.85049 හේමචන්ද්‍ර නිලධාරියා ජීප් රථයේ දාගෙන යට්ටෝගොඩ වෙන්දේසිවත්ත ප්‍රදේශයට ආවා. එසේ ඇවිත් සැකකරුගේ නිවසට මීටර් සීයක් පමණ දුරින් ජීප් රිය නවත්වා පාගමනින්

අප ඒ දෙසට ගියා. ජීප් රථයේ රියදුරු දිල්ශාන් හා පො.කො.80972 සෝමරත්න එතන සිටියා. අපි සියලු දෙනා සැකකරුගේ නිවසට ගියා. එම නිවසේ කිසියම් කණ්ඩායමක් ද සිටියා. පො.සැ.59561 බණ්ඩාර, පො.කො.84239 ප්‍රේමසිරි, පො.සැ.රි.34544 අබේරත්න ද එහි සිටියා. එම අවස්ථාවේදී සැකකරු යැයි සඳහන් අය කෑගසමින් කලහකාරි ලෙස හැසිරෙමින් සිටියා. මූ.පො.ප තුමා ඔහු ලඟට ගිහින් කිව්වා ඔයා කෙනෙකුට ගහලා තියෙනවා ඒකට අත්අඩංගුවට ගන්න ආවේ කියලා, එම වෙලාවේ සැකකරු උස්හඩින් " ගෑනිගෙන් ජරාව කාලා බොරුවට මාව අත්අඩංගුවට ගන්න එනවා"කියලා කෑගැහුවා. ඒ වේලාවේ මූ.පො.ප. තුමා සැකකරුගේ අතින් අල්ලා ගත්තා. සම්පත් සාජන් මහත්තයා ඒ වෙලාවේ හැන්ඩ්කප් දැම්මා. එහෙම කොහොම ද කරන්නේ කියලා සැකකරුගේ මල්ලී සම්පත් සාජන් මහත්තයාගේ පපුවට හා කොන්දට පහර දෙනවා මා දැක්කා. එවිට සම්පත් මහත්තයා පපුව අල්ලාගෙන එහෙම්ම පහත් වුණා. කොහොමහරි සැකකරු අල්ලාගෙන ජීප් රථය දෙසට ගෙනාවා. එහෙත් ඔවුන් සමඟ පැමිණි පිරිස පරුෂ වචන කියමින් පිටුපසින් ආවා. කෙසේ හෝ සැකකරු බලහත්කාරයෙන් ජීප් රථයට දාගත්තා. එම අවස්ථාවේ සැකකරුගේ බිරිඳ හා තාත්තා ද ජීප් රථයට නැග්ගා. තව ද සැකකරු නිවසේ සිට ජීප් රථය දෙසට අරගෙන එන විට ප්‍රේමසිරි නිලධාරියාට පා පහරක් ද එල්ල කරා. එම පහර නිසා ඔහු ඇල පැත්තට වැටුනා. සැකකරු පොලිස් ස්ථානයට රැගෙන ආ පසුව ඔහුගේ මල්ලී වන උදාර රත්නායක පිටු පසින් පැමිණ කලහකාරී ලෙස හැසිරුණා. එහෙම කොහොමද අත්අඩංගුවට ගන්නේ කියා ඔහු කෑගැසුවා. එම අවස්ථාවේදී රාජකාරියට බාධා කිරීම යටතේ ඔහුද අත්අඩංගුවට ගත්තා. පැමිණිලිකරු කියන විදිහට ඔහුට හෝ පිරිසට අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හෝ පසුව කිසිම නිලධාරියෙක් පහර දුන්නේ නෑ. අත්අඩංගුවට ගැනීමේදී ඔවුන් කලහකාරි ලෙස හැසිරුන නිසා අවම බලය පාවිච්චි කර අත්අඩංගුවට ගත්තා."

<u>4 වන වගඋත්තරකාර පො.සැ.59561 බණ්ඩාර යන අයගේ කරුණු දැක්වීමෙ</u>

4 වන වගඋත්තරකාර පො.සැ.59561 බණ්ඩාර යන අය විසින් 2025.12.07 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

"2023.04.01 වන දින මා කෑගල්ල පොලිස් ස්ථානයට ස්ථානමාරුවක් ලබා පැමිණියා. 2023.06.25 වන දින මා රාත්‍රී ජංගම සංචාරයේ පො.කො.84239 ප්‍රේමසිරි සහ පො.කො.රි.80972 සෝමරත්න සමඟ පො.සැ.රි.34544 අබේරත්න විසින් පදවන ලද WPABV-0865 ත්‍රීවීල් රථයේ රාජකාරියේ නියුක්තව සිටිය දී රෑ 19ට පමණ මූ.පො.ප. තුමා විසින් දැනුම් දුන්නා MCR 192/23 පැමිණිල්ලට අදාළව සැකකරු වන වෙන්දේසිවත්තේ යටටෝගොඩ ලිපිනයේ පදිංචි "වානක" නොහොත් කාංචන සාලිය රත්නායක අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන ලෙසට. එතුමාගේ නියෝගය අනුව පැය 19.30ට පමණ සැකකරුගේ නිවසට ආසන්න ස්ථානයට ළඟා වූ අතර නිවසට මීටර් 100ක් පමණ දුරින් ත්‍රීරෝද රථය නවත්වා එහි ආරක්ෂාවට පො.සැ.රි.34544 අබේරත්න නිලධාරියා නතර කර මා හා පො.කො.84239 ප්‍රේමසිරි හා පො.කො.රි.80972 සෝමරත්න සමඟ සැකකරුගේ නිවසට ගියා. එම අවස්ථාවේ අප දුටුවා නිවසේ විදුලි පහන් දල්වා ජනෙල් විවෘත කර දොර වසා තිබුණා. අප නිවස ලඟට ගොස් ගෙදර කවු ද

ඉන්නේ යැයි කතා කළා. එවිට ජනේලය ළඟට පුද්ගලයෙක් පැමිණියා. මා ඇසුවා "වානක ඉන්නව ද" කියලා. "අපි කෑගල්ල පොලීසියෙන්. පුද්ගලයෙකුට පහර දී තුවාල සිදු කිරීමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට ආවේ" යනුවෙන් පැවසුවා. එවිට ජනේලය ළඟට පැමිණි පුද්ගලයෙක් "ඇයි මම වානක තමා කෑගල්ල මුලු පොලීසියම ආවත් තොපිට මාව අරන් යන්න බෑ" යනුවෙන් උස් හඩින් ප්‍රකාශ කරා. ඒ සමඟම නිවස තුළ සිටි කිහිපදෙනෙක් "තොපිට වාමරව ගෙනියන්න දෙන්නේ නෑ" යනුවෙන් උස් හඩින් පැවසුවා.

මෙසේ ප්‍රතිවිරෝධය පෑම නිසා මූ.පො.ප තුමාට ජංගම දුරකතනයෙන් ඇමතුමක් ලබාගෙන MCR 193/23හි වගඋත්තරකරු වන වානක නිවසේ සිටින බවත්, ඔහු අත්අඩංගුවට ගැනීමට නිවැසියන් දොර විවෘත නොකරන බවත් කිව්වා. එවිට මූ.පො.ප.තුමා මා වෙත දැනුම් දුන්නා හැකි ඉක්මනින් එම ස්ථානයට පැමිණෙන බව. පැය 19.45ට පමණ මූ.පො.ප.තුමා අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක පුෂ්කුමාර මහතා, පො.සැ.64324 සම්පත්, පො.කො.85049 හේමචන්ද්‍ර, පො.කො.10419 රෝහණ යන නිලධාරීන් සමඟ ස්ථානයට පැමිණි අවස්ථාවේදී වානක නැමැති අය අවේගශීලීව හැසිරුණා. "තොපිට හොඳ වැඩක් කරන්නම්" කියා නිවසේ පිටුපස පැත්තෙන් වානක හා නිවස තුළ සිටි පිරිසක් එළියට ආවා. එම අවස්ථාවේදී වානක නැමැත්තා අසභ්‍ය වචන කියමින් අපට බැන වැදුණා. සැකකරුගේ බිරිඳ, මල්ලී ඇතුලු පිරිසක් සැකකරු රැගෙන යාමට නොදී පොර බැදුවා. මේ අවස්ථාවේදී මා දුටුවා පො.සැ.64324 සම්පත් නිලධාරියාගේ පපුවට වැරෙන් පහරක් ගහනවා. සැකකරු උඩු කයට ඇඳ සිටි ටී ෂර්ට් එක ඉරා දමා "වීඩියෝ කරපන්" කියා කෑගැසුවා. ඉන්පසු සැකකරුගේ අතට මාංචු දැම්මා. කෙසේ හෝ ඔහු රැගෙන ජීප් රථය දෙසට යන විට පො.කො.84239 ප්‍රේමසිරි නිලධාරියාට ද සැකකරු පයින් පහරක් එල්ල කළා. ඔහු අසළ තිබුණු වැවට වැටුණා.ඉන්පසුව අවම බලය යොදමින් සැකකරු ජීප් රථයට දැමීමට කටයුතු කළා. එම අවස්ථාවේදී සැකකරුගේ බිරිඳ හා පියාද ජීප් රථයට නැග්ගා. සැකකරුගේ මල්ලී ජීප් රථයට පහර දුන්නා. කෙසේ හෝ ඔහුව රැගෙන පොලිස් ස්ථානයට ආවා. පොලිස් ස්ථානයට ආ පසුව ඔවුන් පිටුපස සැකකරුගේ මල්ලී සහ තවත් පිරිසක් පැමිණියා. සැකකරුගේ මල්ලී වන ප්‍රමෝද් යන අය කළහකාරීව හැසිරුණා. මෙම අවස්ථාවේ රාජකාරියට බාධා කිරීම, පොලිස් නිලධාරීන්ට පහර දීම යන චෝදනා කියා දී ඔහු ද අත්අඩංගුවට ගත්තා. මෙම අත්අඩංගුවට ගැනීමේදී නිලධාරීන් පහර දීමක් සිදු කර නොමැති අතර ඔවුන්ගේ කලහකාරී හැසිරීම නිසා අවම බලය යොදා අත්අඩංගුවට ගෙන පොලිස්ථානයට රැගෙන ආවා."

<u>5 වන වගඋත්තරකාර පො.කො.84239 ප්‍රේමසිරි යන අයගේ කරුණු දැක්වීම</u>

5 වන වගඋත්තරකාර පො.කො.84239 ප්‍රේමසිරි යන අය විසින් 2025.12.07 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

"මා 2023 වසරේ මුල් කාලයේදී කෑගල්ල පොලිස් ස්ථානයේ සේවයට පැමිණියා. 2023.06.25 වන දින පො.කො.රි. 34344 අබේරත්න විසින් පදවන ලද ABV-0865 දරණ ත්‍රිවිල් රථයෙන් මාත් පො.සැ.59561 බණ්ඩාර, පො.කො.රි.80792 සෝමරත්න සමඟ රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටිය දී

මූ.පො.ප. ස්ථානයට අවශ්‍ය සැකකරුවෙක් වන වෙන්දේසිවත්ත යටිටෝගොඩ ලිපිනයේ පදිංචි චානක නොහොත් කාංචන සාලිය රත්නායක අත්අඩංගුවට ගන්නා ලෙස පො.සැ.59561 බණ්ඩාරට දැනුම් දුන්නා. එම නියෝගය අනුව සැකකරු පදිංචි වී සිටින නිවස ආසන්නයට ගොස් ත්‍රීරෝද රථයේ ආරක්ෂාවට පො.කො.රි. 80792 සෝමරත්න නතර කර අප දෙදෙනා සැකකරුගේ නිවසට ගොස් චානක ඉන්නවාදැයි විමසුවා. නිවස තුළ සිටි පුද්ගලයෙකු ජනේලය ළඟට ඇවිත් "මම තමා චානක කෑගල්ල පොලීසිය නිල්මිණි හෝටලයෙන් ජරාව කාලා මාව පොලිසියට අරන් යන්න හදනවා කියලා" බැන්නා. එම අවස්ථාවේදී සාජන් මහත්තයා මූ.පො.ප. තුමාට දුරකතනයෙන් කතා කොට ඒ බව කිව්වා. ටික වේලාවකින් මූ.පො.ප. තුමා එතනට ආවා. මූ.පො.ප තුමා අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවය කිව්වා නමුත්, ඔහු ඊට අවනත නොවී පිටුපස දොරින් හතර පහක් වැනි කණ්ඩායමක් සමඟ නිවසින් පිටතට පැමිණ කලහකාරි ලෙස හැසිරුණා. ජීප් රථය දෙසට රැගෙන යන කොට ඔහු විසින් මා හට පා පහරක් එල්ල කිරීම නිසා මා ඒ අසළ තිබුණු ඇලට වැටුණා. මගේ යුනිෆෝම් එකත් ඉරුණා. කෙසේ හෝ මූ.පො.ප. තුමා ඇතුලු කණ්ඩායම සැකකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගියා. අප පැමිණි ත්‍රීරෝද රථයෙන් පොලිස් ස්ථානයට ගොස් නැවත ජංගම සංචාරය සඳහා ගියා. සැකකරු අත්අඩංගුවට ගැනීමේදී නිලධාරීන් කිසිදු පහර දීමක් සිදු කළේ නෑ. අවම බලය පාවිච්චි කළා පමණයි."

**<u>6 වන වගඋත්තරකාර පො.කො.85049 හේමචන්ද්‍ර යන අයගේ කරුණු දැක්වීම</u>**

6 වන වගඋත්තරකාර පො.කො.85049 හේමචන්ද්‍ර යන අය විසින් 2025.11.14 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

"මා 2021.01.14 වන දින සිට කෑගල්ල පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන ලද අතර දැනට කඩුගන්නාව පොලිස් ස්ථානයේ සේවයේ යෙදී සිටිනවා. මෙම සිද්ධිය වූ 2023.06.25 වන දින මා පො.ප. පුෂ්පකුමාර, පො.සැ. 64324 සම්පත් සමඟ අපරාධ නිවාරණ රාජකාරියේ යෙදී සිටියා. මා විසින් පදවන ලද WP-ABV 1953 දරණ ත්‍රීරෝද රථයේ අප රාජකාරි කරමින් සිටියා. එම අවස්ථාවේ මූ.පො.ප.තුමා විසින් පො.ප. පුෂ්පකුමාර මහතාට දුරකතනයෙන් කතා කර කියා තිබෙනවා සුළු අපරාධ ලේඛණ 192/2023 ට අදාළ සැකකරු අත්අඩංගුවට ගැනීමට සහය වන ලෙස, ඉන් ටික වේලාවකට පසු අප සිටින ස්ථානයට මූ.පො.ප. තුමා ජීප් රථයෙන් පැමිණියා. අප තිදෙනා ජීප් රථයට නැග සැකකරු පදිංචිව සිටින යටිටෝගොඩ ප්‍රදේශයට ගියා. එම ජීප් රථයේ රියදුරු ලෙස පො.කො.රි. 105505 දිල්ශාන්, පො.කො.10419 රෝහණ නිලධාරීන් ද සිටියා. ජීප් රථය නවත්වා අප සියලු දෙනා සැකකරුගේ නිවසට ගියා. සැකකරු මිදුලේ සිටියා. ඔහු කුණුහරප කියමින් නිලධාරීන්ට කෑ ගසමින් කලහකාරි ලෙස අත් අඩංගුවට ගැනීමට විරෝධය පාමින් සිටියේ. එම අවස්ථාවේ මූ.පො.ප. තුමා අත් අඩංගුවට ගැනීමට උත්සහ දැරුවා. සම්පත් සාජන් මහත්තයා අත් විලංගු දැමීමට යන අවස්ථාවේ ප්‍රමෝද් උදාර නැමැත්තා සම්පත් සාජන් මහත්තයාට පහර දුන්නා. අතක් ඇඹරුවා. කෙසේ හෝ ඔහුගේ විරෝධය මැද ජීප් රථයට නංවා ගත්තා. ඉන් පසුව මා පැදවූ ත්‍රීවීල් රථය රැගෙන පොලිස් ස්ථානයට ආවා. පොලිස් ස්ථානයේදී ද සැකකරු සහ ඔහුගේ මල්ලී කලහකාරි ලෙස හැසිරුණා. ඒ නිසා දෙදෙනාම

අත්අඩංගුවට ගත්තා. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී හෝ පසුව කිසිදු පහරදීමක් සිදු කළේ නෑ. අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔවුන්ගේ ප්‍රතිවිරෝධය නිසා බලය පාවිච්චි කිරීම පමණයි සිදුවුණේ."

**<u>7 වන වගඋත්තරකාර පො.සැ.රි.34544 අබේරත්න යන අයගේ කරුණු දැක්වීම</u>**

7 වන වගඋත්තරකාර පො.සැ.රි.34544 අබේරත්න යන අය විසින් 2025.11.14 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

"මා 2021 පමණ සිට කෑගල්ල පොලිස් ස්ථානයේ සේවයේ යෙදී සිටිනවා. 2023.06.26 වන දින මා පැදවූ ABV-0865 ත්‍රීවිල් රථය පො.සැ. 59561 බණ්ඩාර, පො.කො.රි.80792 සෝමරත්න සමඟ ජංගම සංචාරයේ යෙදී සිටියා. එම අවස්ථාවේ මූ.පො.ප.තුමාගේ නියෝගය පරිදි යට්ටෝගොඩ වෙන්දේසිවත්තේ පහරදීමට අදාළ සැකකරුවෙක් සිටින බවත්, ඔහුව අත්අඩංගුවට ගන්නා ලෙස පො.සැ.59561 බණ්ඩාරට මූ.පො.ප.තුමා විසින් දුන් උපදෙස් අනුව ත්‍රීරෝද රථයෙන් ස්ථානයට ගියා. මාත් පො.සැ.59561 බණ්ඩාර මහත්තයාත් සැකකරුගේ නිවසට ගියා. පො.කො.රි.80972 සෝමරත්න ත්‍රීරෝද රථය ළඟ නැවතුනා. අපි දෙදෙනා යුනිෆෝම් ඇඳගෙන හිටියේ. බණ්ඩාර සාජන් මහත්තයා නිවස ළඟට ගියා. අප දැක්කා නිවසේ 10ක 15ක පමණ පුද්ගලයින් පිරිසක් සිටින බව. බණ්ඩාර සාජන් මහත්තයා පිරිස ළඟට ගිහින් ඇහුවා "චානක කියලා කෙනෙක් ඉන්නව ද" කියල. එම නිවස තුළ ඉඳලා ආපු කෙනෙක් "මම තමා චානක, පුලුවන් දෙයක් කරපල්ලා. තොපි අර ගෑනිගේ ජරාව කාලා මාව අල්ලන්න එනවා" කියලා කෑගැහුවා. ඒ අවස්ථාවේ ඔවුන් බීමත්ව වගේ හිටියේ. තවත් හතර දෙනෙකු පමණ කෑ ගසමින් සිටියා. එම අවස්ථාවේ බණ්ඩාර සාජන් මහත්තයා මෙතන තිබෙන තත්වය මූ.පො.ප.තුමාට කිව්වා. ඉන් ටික වේලාවකට පසු මූ.පො.ප.තුමා, පො.ප. පුෂ්පකුමාර මහත්තයා සමඟ තවත් නිලධාරීන් තුන් හතරදෙනෙක් එතනට ආවා. එම අවස්ථාවේ චානකට එළියට එන්න කිව්වා. නමුත් ඔවුන් එළියට ආවේ නෑ. ටික වේලාවකින් පිටිපස පැත්තෙන් පිරිසක් අප දෙසට ආවා. එම අවස්ථාවේ සැකකරු එතන හිටියා. එම අවස්ථාවේ මූ.පො.ප.තුමා සැකකරුගේ අතින් අල්ලා ගත්තා. එවිට සම්පත් සාජන් මහත්තයා ඔහුගේ අතට මාංචු කුට්ටම දැම්මා. එම අවස්ථාවේ තවත් අයෙකු පිටුපසින් පැමිණ සම්පත් සාජන් මහත්තයාට ගැහුවා මම දැක්කා. පසුව ඔවුන් පරුෂ වචන වලින් බැන්නා. විටින් විට ඔවුන් පහරදීම් කරනවාද දැක්කා. කොහොමහරි සැකකරු අත්අඩංගුවට ගෙන වාහනය නවත්වා ඇති දිහාවට ගෙනාවා. නමුත්, අත්අඩංගුවට ගැනීමට ප්‍රතිවිරෝධය දැක්වූවා. එම අවස්ථාවේ ප්‍රේමසිරි සාජන් මහත්තයාට සැකකරුගේ මල්ලී විසින් පා පහරක් ගැහුවා. ඔහු පහළ කාණුවට වැටුණා මා දුටුවා. පසුව සැකකරු ජීප් රථය ළඟට ගෙන ගොස් ජීප් රථය තුළට දාගත්තා. එම අවස්ථාවේදී ඔහුත් සමඟ තවත් දෙදෙනෙක් ජීප්රථයට බලහත්කාරයෙන් නැග්ගා. කෙසේ හෝ ජීප් රථයෙන් ඔහුව පොලිස් ස්ථානයට අරගෙන ගියා. පසුව අප තිදෙනා අපගේ ත්‍රීරෝද රථයෙන් පොලිස් ස්ථානයට ආවා. පොලිස් ස්ථානයේදී සැකකරු හා ඔහුගේ මල්ලී කලහකාරී ලෙස හැසිරුණා. පසුව මා හා පො.සැ.59561 බණ්ඩාර, පො.කො.රි.80972 සෝමරත්න සමඟ ජංගම රාජකාරිය සඳහා ගියා. මෙම අවස්ථාවේ මා හෝ නිලධාරීන් කිසි කෙනෙකු පැමිණි සැකකරුට හෝ අනෙක් අයට කිසිදු පහරදීමක්

කළේ නෑ. සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු කලහකාරි ලෙස හැසිරුණ නිසා අවම බලය පාවිච්චි කර අත්අඩංගවට ගැනීම පමණයි සිද්ද වුණේ.”

**8 වන වගඋත්තරකාර පො.කො.රි. 80972 සෝමරත්න යන අයගේ කරුණු දැක්වීම**

8 වන වගඋත්තරකාර පො.කො.රි. 80972 සෝමරත්න යන අය විසින් 2025.11.14 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

“එදා 2023.06.25 වන දින මා ජංගම සංචාරයේ පො.සැ.රි.34544 අබේරත්න පැදවූ අංක ABV-0865 දරණ ත්‍රීවිල් රථයෙන් මාත් පො.සැ.59561 බණ්ඩාර යන අය සේවයේ යෙදී සිටියා. එම අවස්ථාවේ ඉන්චාර්ජ් ලෙස කටයුතු කරේ බණ්ඩාර සාජන් මහත්තයායි. ඔහුට එම අවස්ථාවේ මූ.පො.ප තුමා දැනුම් දී තිබෙනවා යටිවෝගොඩ වෙන්දේසිවත්තේ පහර දීමට අදාළ සැකකරුවෙකු සිටිනවා. ඔහුව අත්අඩංගුවට ගන්න කියලා ඒ අනුව අප එම ප්‍රදේශයට ගියා. අප නිවස අසළට ගියේ ත්‍රීරෝද රථය නිවසට මීටර් 100ක් පමණට ආසන්නයේ නවත්තලා. මා ත්‍රීරෝද රථය ළඟ සිටියා. බණ්ඩාර සාජන් මහත්තයා සහා මා පො.සැ.රි. 34544 අබේරත්න සැකකරුගේ නිවස දෙසට ගියා. සැකකරුගේ නිවස මා සිටි ස්ථානයට පේන්නේ නෑ. ඉන් විනාඩි 20කට පමණ පසු මූ.පො.ප තුමා ජීප් රථයෙන් තවත් නිලධාරීන් පිරිසක් සමඟ පැමිණියා. මූ.පො.ප. පුෂ්පකුමාර මහත්තයා පැමිණියා. මහත්තයා සිටියේ සිවිල් ඇඳුමින්. මාත් බණ්ඩාර සාජන් මහත්තයා හා පො.සැ.රි.34544 අබේරත්න යුනිෆෝම් ඇඳගෙන සිටියා. අනෙක් නිලධාරීන් සිවිල් ඇඳුමින් සිටියේ. ජීප් රථය පදවාගෙන ආ පො.කො.රි. 105505 දිල්ශාන් ගියේ නෑ. අප දෙදෙනාම රැදී සිටියා. ගිය නිලධාරීන් සියලුදෙනා ඉන් ටික වේලාවකට පසු සැකකරු ජීප් රථය ළඟට රැගෙන ආවා. සැකකරු සමඟ තවත් කිහිප දෙනෙකු කලහකාරි ලෙස හැසිරෙමින් එතනට පැමිණියා. ඔවුන් පරුෂ වචනයෙන් එම නිලධාරීන්ට බැණ වැදුනා. පසුව සැකකරු ජීප් රථයට නංවා ගත්තා. එත් සමඟම තවත් දෙදෙනෙකු ජීප්රථයට බලහත්කාරයෙන් නැග්ගා. ඔවුන් සියලු දෙනා ජීප් රථයෙන් පොලිස් ස්ථානයට රැගෙන ගියා.මා සමඟ ගිය නිලධාරීන් ත්‍රී රෝද රථයෙන් පොලිස් ස්ථානයට ආවා. සැකකරු ඇතුලු පැමිණි පිරිස කලහකාරි ලෙස හැසිරුණා. ඉන් ටික වේලාවකට පසු අපි නැවත ජංගම සංචාරය සඳහා පිටව ගියා. සැකකරුට ජීප් රථය අසළ දී හෝ පොලිස් ස්ථානයේදී පහරදෙනවා මා දුටුවේ නෑ.”

**9 වන වගඋත්තරකාර පො.සැ.64324 සම්පත් යන අයගේ කරුණු දැක්වීම**

9 වන වගඋත්තරකාර පො.සැ.64324 සම්පත් යන අය යන අය විසින් 2025.11.14 වන දින කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශ කර ඇත.

“2023.06.25 වන දින මා හා පො.ප.පුෂ්පකුමාර, පො.කො.85049 හේමචන්ද්‍ර නිලධාරීන් සමඟ අපරාධ නිවාරණ රාජකාරියේ නිරතව සිටියා. එදින අප ස්ථානයට අනුයුක්ත කර තිබෙන WP-ABV 1953 දරණ ත්‍රී රෝද රථයෙන් අපරාධ නිවාරණ රජකාරියේ නිරතව සිටියා. රාජකාරියේ නිරතව සිටින විට මූ.පො.ප.

විසින් පො.ප. පුෂ්පකුමාර මහතාට දුරකථන පණිවිඩයක් ලබා දී සුළු අපරාධ ලේඛණ අංක 192/2023ට අදාළ සැකකරු වන යට්ටෝගොඩ වෙන්දේසිවත්ත ප්‍රදේශයේ සිටින බවත්, ඔහු අත්අඩංගුවට ගැනීමට රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරීන්ට දැනුම් දුන්න ද ඔවුන් නිවසට ගිය විට සැකකරු නිලධාරීන්ට බැනවැදී අත්අඩංගුවට ගැනීමට නොදී ප්‍රතිවිරෝධය පාන බවත්, එම නිසා සැකකරු අත්අඩංගුවට ගැනීමට සහය වන ලෙස පො.ප. පුෂ්පකුමාර මහතාට දැනුම් දෙන ලෙසට අපට කියා සිටියා. අප කණ්ඩායම ගලිගමුව නගරයේ සංචාරය කරන විට මූ.පො.ප.තුමා ජීප් රථයෙන් පැමිණ ත්‍රී රෝද රථය නතර කර ජීප් රථයට නගින ලෙස උපදෙස් ලබා දුන්නා. පසුව අප ත්‍රීරෝද රථය ගලිගමුව බැංකුවක් අසළ නතර කර පො.ප. පුෂ්පකුමාර නිලධාරියාත්, පො.කො.85049 හේමචන්ද්‍ර නිලධාරියාත් මාත් ජීප් රථයට ගොඩවුණා. ඊට පස්සේ මූ.පො.ප.තුමා දැනුම් දුන්නා යට්ටෝගොඩ වානක නැමැත්තා අත්අඩංගුවට ගන්න යන්නේ කියා. මා පෙර අවස්ථා කිහිපයකදී පො.ප. ගුණරත්න මහතා සමඟ එම සැකකරු අත්අඩංගුවට ගැනීමට නිවසට ගිහින් තිබුණ නිසා නිවසට යන මාර්ගය මා දැනගෙන සිටියා. අප ජීප් රථය නිවස අසල නතර කර පා ගමනින් නිවසට ගමන් කළා.

නිවස අසළ පො.සැ. 59561 බණ්ඩාර, පො.සැ.34544 අබේරත්න, පො.කො.84239 ප්‍රේමසිරි යන නිලධාරීන් සිටියා. සැකකාර සාලිය රත්නායක නැමැත්තා ඔහුගේ නිවසේ පැත්තකට වෙන්න තිබුණු ගරාජය අසළ සිට නිලධාරීන්ට “තොපිට පුලුවන් ද මාව ගෙනියන්න, මුලු පොලීසියම ගෙනාවත් මාව ගෙනියන්නේ කොහොම ද, කඬේ ගැනිගෙන් ජරාව කන බල්ලෝ” ලෙස බැන වදිමින් සිටියා. සැකකරු ආසන්නයේ සැකකරුගේ බිරිඳ, පියා සහ තවත් කිහිප දෙනෙකු රැඳී සිටියා. මූ.පො.ප. තුමා හා පො.ප. පුෂ්පකුමාර මහතා සැකකරු ආසන්නයට ගිහින් සැකකරුට විරුද්ධව ඇති චෝදනා කිව්වා. මෙම අවස්ථාවේදී ද ඔහු කලහාකාරි ලෙස හැසිරුණා. එම අවස්ථාවේදී මූ.පො.ප තුමා සැකකරුගේ අතින් අල්ලා ගත් අතර පො.ප. පුෂ්පකුමාර මහතා ඊට සහය වුණා. සැකකරු අත්අංඩගුවෙන් මිදීමට උත්සහ දරණ නිසා මා අත තිබූ අත්විලංගුව වම් අතට දමා අනෙක් කොටස දකුණු අතට දැමීමට උත්සහ කිරීමේදී සැකකරුගේ මල්ලී බව සඳහන් කොණ්ඩය දිගට වවාගත් අයෙකු “තොපි කොහොම ද අපේ අයියාව ගෙනියන්නේ” කියා මගේ අතින් ඇද අත අඹරවා මගේ පපුව පැත්තට පහර දුන්නා. මට ඒ වේලාවේ වේදනාවක් ඇතිවුණා. වේදනාවට කෑගැසුවා. සැකකරු ජීප් රථය දෙසට අනෙක් නිලධාරීන් විසින් රැගෙන යාමට උත්සහ කිරීමේදී ඔහු සමඟ සිටි අනෙකු පිරිස ඊට බාධා කළා.

සැකකරුගේ මල්ලී වන ප්‍රමෝද් උදාර නිලධාරීන්ට පහර දෙනවා මා දුටුවා. සැකකරු ජීප් රථය දෙසට රැගෙන යන අවස්ථාවේදී සැකකරු පො.සැ 84239 ප්‍රේමසිරි නිලධාරියාට පා පහරක් එල්ල කිරීම නිසා ඔහු අසළ තිබූ කාණුවට වැටෙනවා මා දුටුවා. සැකකරු ජීප් රථයට නංවා ගන්නා අවස්ථාවේදී කළහකාරී ලෙස හැසිරුණා. ඉතා අමාරුවෙන් ඔහු ජීප් රථයට නංවා ගන්නා අතරේ ඔහුගේ බිරිඳ හා පියා සැකකරු ළඟින් වාඩි වුණා. සැකකරුගේ මල්ලී පරුෂ වචනයෙන් බැන වදිමින් ජීප් රථයේ වම් කණ්නාඩියට අතින් පහර දුන්නා. කෙසේ හෝ සැකකරු පොලිස් ස්ථානයට රැගෙන ආවා. ඒ පස්සෙන් සැකකරුගේ මල්ලී ද පොලිස් ස්ථානයට පැමිණ කලහකාරි ලෙස හැසිරුණා. පොලිස් ස්ථානයේ සිට ඔහුගේ මල්ලී රාජකාරියට බාධා කිරීම යටතේ අත්අඩංගුවට ගත්තා. සැකකරුගේ නිවසේදී ඔහුගේ මල්ලී මා හට

පහර දීම නිසා ඇති වූ වේදනාව නිසා හුස්ම ගැනීමට අපහසුතාවයක් ඇති වූ බැවින් මූ.පො.ප තුමාට දැනුම් දී පො.ප.පුෂ්පකුමාර මහතා සමඟ පො.කො. හේමචන්ද්‍ර පදවන ලද ත්‍රී රෝද රථය කෑගල්ල රෝහලට ගොස් ඇඳ ඉහපත් අංක 40359 යටතේ ප්‍රතිකාර සඳහා හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුලත් වී මූලික ප්‍රතිකාර ලබා දීමෙන් අනතුරුව පහේ වාට්ටුවට ඇතුළත් කළා. 2023.06.26 වන දින අධිකරණ වෛද්‍ය නිලධාරිතුමාට ඉදිරිපත් කිරීමෙන් පසු මා ප්‍රතිකාර කොට පිටත් කළා. එදිනම ස්ථානයට පැමිණ සිද්ධියට අදාළ මාගේ සටහන් යෙදීමට කටයුතු කළා. මෙම අය අත්අඩංගුවට ගැනීමට මීට පෙර ගුණරත්න මහතා සමඟ කිහිප අවස්ථාවකදී සැකකරුගේ නිවසට ගිය ද සැකකරුගේ පියා එම අවස්ථාවේ සිටියත් ඔහු සිටියේ නෑ. පොලිස් ස්ථානයට පැමිණෙන ලෙස කිහිප අවස්ථාවකදී දැනුම් දුන්න ද ඔහු පැමිණියේ නෑ. එම නිසා එදින ඔහු අත්අඩංගුවට ගැනීමට ගියේ අප කිසිදු අවස්ථාවක ඔහුට පහරදීමක් කළේ නෑ. අත්අඩංගුවට ගැනීමට යාමේදී ඔහු කළහාකාරි ලෙස හැසිරුණ නිසා අවශ්‍ය බලය පාවිච්චි කර අත්අඩංගුවට ගැනීමට මූ.පො.ප තුමාට සහය වුණා.”

## නිරීක්ෂණ

2023.03.20 වන දින රාත්‍රී 11.00ට පමණ යට්ටෝගොඩ පදිංචි චානක යන අය විසින් පහර දී ගෙල බැඳි රත්තරන් පවුම් එකහමාර (1 ½)ක් බර ඇති රු.157,000.00ක් වටිනා රන් මාලයක් කඩා ගත් බවට ගලිගමුව නගරයේ පිහිටි නිල්මිණි හෝටලයේ හිමිකාර රුක්මන් වනිගසේකර යන අය කෑගල්ල රෝහල් පොලීසිය වෙත දැනුම් දුන් බවත්, එලෙස පහරදීම හේතුවෙන් ඉහත කී රුක්මන් වනිගසේකර යන අය කෑගල්ල ශික්ෂණ රෝහලේ අංක 05 වාට්ටුවේ බී.එච්.ටී. 17681/23 යටතේ ප්‍රතිකාර ලබන බවත් කෑගල්ල රෝහල් පොලීසිය දුරකථන පණිවිඩ 1744 මඟින් කෑගල්ල පොලිස් ස්ථානය වෙත දැනුම් දී ඇති බව කෑගල්ල පොලිස් ස්ථානය මගින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

එසේම, 2023.03.21 වන දින පැය 13.25ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 156 සහ ඡේදය 266 යටතේ යොදා ඇති සටහන අනුව උ.පො.ප. අනුර නිලධාරියා විසින් ඉහත කී කෑගල්ල රෝහල් පොලීසිය මගින් ලබා දී තිබූ දුරකථන පණිවිඩ 1744ට අදාළව කෑගල්ල ශික්ෂණ රෝහලට ගොස් ප්‍රතිකාර ලබන රුක්මන් වනිගසේකර යන අයගේ ප්‍රකාශයක් පො.කො.90247 නිලධාරියා ලවා සටහන් කරවාගෙන ඇත. එහිදී රුක්මන් වනිගසේකර යන අය ප්‍රකාශ කර ඇත්තේ, තමා රැකියාව වශයෙන් ආහාරපාන සහිත වෙළඳසැලක් පවත්වාගෙන යන බවත්, 2023.03.20 වන දින රාත්‍රී 11.00ට පමණ තමා එම වෙළඳසැලෙහි සිටියදී චානක නැමැති අය පැමිණි බවත්, ඔහු තම බිරිඳගෙන් සිගරට් පහක් ඉල්ලූ බව තමාට ඇසුණු බවත්, එවිට සිගරට් ලබා දීම සඳහා තම බිරිඳ මුදල් ඉල්ලූ විට චානක නැමැති අය මුදල් දෙන්නේ නොමැති බව පැවසූ බවත්, ඒ වේලාවේදී මුදල් නොමැතිව භාණ්ඩ ලබාදීමට තම කඩය දන්සැලක් නොවන බව තම බිරිඳ පවසා සිටි බවත් ය. එසේම, එවිට චානක නැමැති අය විසින් හොඳින් හෝ නරකින් තම කඩයෙන් භාණ්ඩ ගන්නා බව පැවසූ බැවින් එලෙස හොඳින් හෝ නරකින් භාණ්ඩ ගැනීමට එය ඔහුගේ කඩයක් දැයි තමා චානක නැමැති අයගෙන් ඇසූ බවත්, එවිට චානක නැමැති අය තම බෙල්ලෙන් අල්ලා තමාට පහර දුන් බවත්, පහර දුන්

විට තමා බිම වැටුණු බැවින් බිම දමාගෙන පහර දුන් බවත්, අවට සිටි අය තමාව බේරාගෙන පුටුවක වාඩි කරවූ බවත්, එම අවස්ථාවේදී තමාගේ බෙල්ලෙන් දැවිල්ලක් ආ නිසා බෙල්ල අතගා බැලූ බවත්, එවිට බෙල්ලෙහි තිබූ මාලය නොමැති බව වැටහුණු බවත්, එය බිම තිබේද යන්න සොයා බැලුවද එය හමු නොවූ බැවින් වානක නැමැති අය මාලය කඩාගත් බවට තමා සැක කරන බවත් රුක්මන් වනිගසේකර යන අය ප්‍රකාශ කර ඇත.

එසේම, 2023.03.21 වන දින පැය 13.45ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 164 සහ ඡේදය 268 යටතේ යොදා ඇති සටහන අනුව ඉහත කී රුක්මන් වනිගසේකර යන අය හට පහරදීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පො.ප. ගුණරත්න නිලධාරියා ඇතුලු නිලධාරීන් පිරිසක් පිටත්ව ගොස් ඇත. එසේම, 2023.03.21 වන දින පැය 16.35ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 167 සහ ඡේදය 270 යටතේ යොදා ඇති පො.ප. ගුණරත්න නිලධාරියාගේ පැමිණීමේ සටහන අනුව අදාළ පහරදීම සිදු වූ නිල්මිණි හෝටලය වෙත ගොස් අදාළ අපරාධය සිදු වූ ස්ථානය පරීක්ෂා කළ බවත්, එම අවස්ථාවේදී තුවාලකරු (රුක්මන් වනිගසේකර) ගේ බිරිඳ සහ පුතා එහි සිටි බවත්, වානක නැමැති අය රුක්මන් වනිගසේකර යන අයට පහරදුන් බව රුක්මන් වනිගසේකරගේ බිරිඳ සහ පුතා පැවසූ බවත්, රුක්මන් වනිගසේකර යන අයගේ ගෙල බැඳි රන් මාලය වානක නැමැති අය කඩාගත් බව ඔවුන් නොදුටු බවත්, රෝහල් ගත කිරීම සඳහා රැගෙන යන අවස්ථාවේදී තම රන් මාලය නොමැති බව රුක්මන් වනිගසේකර යන අය ප්‍රකාශ කළ බවට ඔවුන් පැවසූ බවත් සඳහන් කර ඇත. පො.ප. ගුණරත්න නිලධාරියාගේ නිරීක්ෂණ සටහන්වල තවදුරටත් සඳහන් වනුයේ මෙම රුක්මන් වනිගසේකර යන අය සහ වානක යන අය අතර ගැටුමෙන් පසු රුක්මන් වනිගසේකර යන අයගේ රන් දම්වැල කැඩී බිම වැටී තිබී වෙළඳසැලේ සිටි වෙනත් අයෙකු ඇහිඳ ගැනීම හෝ ඇති වූ ආරවුල නිසා මෙවැනි චෝදනාවක් කිරීම සිදු විය හැකි බැවින් ඒ පිළිබඳව තවදුරටත් විමර්ශනය කළ යුතුව ඇති බවයි.

තවද, 2023.03.21 වන දින පැය 23.13ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 175 සහ ඡේදය 274 යටතේ පො.කො.90427 වානක නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව එකී සිද්ධියට අදාළව කඩයේ හිමිකරු වන රුක්මන් වනිගසේකර යන අයගේ පුතා වන ක්‍රිස්තොගු බදුගේ නුවන් දිල්ශංක යන අය සිද්ධිය වන අවස්ථාවේ කඩයේ සිට ඇති බැවින් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. ඒ අනුව වානක නැමැති අය විසින් කඩයෙන් කෑම රැගෙන මුදල් නොදීම නිසා බහින් බස් වීමක් ඇති වූ බවත්, පසුව තම පියාට වානක නැමැති අය බිම පෙරලාගෙන පහර දුන් බවත්, එම අවස්ථාවේදී තමා එය බේරීමට උත්සහ කළ බවත්, වානක නැමැති අය පිටවී ගිය පසු පියාගේ ගෙලෙහි තිබූ රන් මාලය නොමැති බව තමා දුටු බවත්, වානක නැමැති අය එම මාලය රැගෙන යන්නට ඇති බව තමා සිතන නමුත්, එය වානක නැමැති අය කඩනවා තමා නොදුටු බවත් රුක්මන් වනිගසේකර යන අයගේ පුතා වන ක්‍රිස්තොගු බදුගේ නුවන් දිල්ශංක යන අය විසින් ප්‍රකාශ කළ බවට සටහන් කර ඇත.

එසේම, රුක්මන් වනිගසේකර යන අයගේ බිරිඳ වන සමරවීර විතානලාගේ නයනා නිල්මිණී යන අයගේ ප්‍රකාශයක් ද සටහන් කරගෙන ඇත. ඒ අනුව ඔවුන් පවත්වාගෙන යන කඩයට 2023.03.20 වන දින රාත්‍රී 11.05ට පමණ වානක යන අය පැමිණ කෑම ණයට ඉල්ලීම නිසා ඇති වූ බහින් බස්වීමක දී වානක යන අය තම සැමියා වන රුක්මන් වනිගසේකර යන අයට බිම පෙරලාගෙන පහර දුන් බවත්, මෙම පහරදීමෙන් පසුව තම සැමියා පැළඳ සිටි රන් මාලය නොතිබූ බවත්, වානක නැමැති අය එම මාලය රැගෙන යන්නට ඇති බව තමා සිතන නමුත්, එය වානක නැමැති අය කඩනවා තමා නොදුටු බවත් රුක්මන් වනිගසේකර යන අයගේ බිරිඳ වන සමරවීර විතානලාගේ නයනා නිල්මිණී යන අය ප්‍රකාශ කර ඇති බවට සටහන් කර ඇත.

එසේම, මෙම සිද්ධියට අදාළව සාක්ෂි වශයෙන් සිද්ධිය වූ දින වානක නැමති අය රුක්මන් වනිගසේකර යන අයගේ කඩයට ගොස් තිබූ අංක එස්.ජී. ඒ.බී.එෆ්. 2141 දරණ ත්‍රීරෝද රථයේ හිමිකාර ඇස්සැල්ලගේ ඉශාන් මධුෂංක තිලකසිරි යන අයගෙන් ද ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බව 2023.03.25 වන දින පැය 15.00ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 226 සහ ඡේදය 320 යටතේ උ.පො.ප. අනුර නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. ඔහුගේ ප්‍රකාශයේද සඳහන් වන්නේ තමා ත්‍රීරෝද රථයෙන් වානක සමඟ සිද්ධිය වූ දින නිල්මිණී හෝටලය (රුක්මන් වනිගසේකර යන අයගේ කඩය)ට කෑම ලබා ගැනීම සඳහා ගිය බවත්, ඉන් ටික වේලාවකට පසුව ශබ්දයක් ඇසී බලන විට කඩයේ හිමිකරු සහ වානක අතර බහින් බස්වීමක් සිදු වූ බව තමා දුටු බවත්, පසුව ඔවුන් දෙදෙනා රණ්ඩු වූ බවත්, එම ස්ථානයේ තිබූ ප්ලාස්ටික් පුටුවක් මතට වැටී පසුව දෙදෙනාම බිමට වැටුණු බවත්, වානක කඩයෙන් එළියට පැමිණි පසු තම ත්‍රීරෝද රථයෙන් යට්ටෝගොඩට ගෙන ගොස් බැස් වූ බවත්, වානක යන අය ඒ වන විට සිටින ස්ථානයක් ඔහු නොදන්නා බවත් ය.

ඉහත කී රුක්මන් වනිගසේකර යන අය, ඔහුගේ බිරිඳ සහ ඔහුගේ පුතා විසින් කෑගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් හට ලබා දී ඇති ප්‍රකාශ අනුව 2023.03.20 වන දින රාත්‍රී 11.00ට පමණ රුක්මන් වනිගසේකර යන අයට වානක නැමති අය විසින් පහරදීමක් සිදු කළ බවට පොලිස් ස්ථානය වෙත තොරතුරු ලැබී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, වානක නැමති අය අදාළ හෝටලයට ගොස් තිබූ අංක එස්.ජී. ඒ.බී.එෆ්. 2141 දරණ ත්‍රීරෝද රථයේ හිමිකාර ඇස්සැල්ලගේ ඉශාන් මධුෂංක තිලකසිරි යන අය විසින් ද රුක්මන් වනිගසේකර යන අය සහ වානක නැමැති අය අතර රණ්ඩුවක් ඇති වූ බවට සඳහන් කර ඇති බව පෙනී යයි.

2023.04.09 වන දින පැය 16.00ට කෑගල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාශ අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 187 සහ ඡේදය 71 යටතේ පො.ප. ජයන්ත නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව ඉහත කී වානක නැමති සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා 2023.04.09 වන දින පො.ප. ජයන්ත නිලධාරියා ඇතුලු නිලධාරීන් පිරිසක් 2023.04.09 වන දින පැය 10.15ට කෑගල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාශ අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 187 සහ ඡේදය 69 යටතේ යටතේ සටහන් යොදා පිටව ගොස් ඇති බවත්, වානක යන අය සොයා ඔහුගේ නිවසට ගිය බවත්, එම නිවසේ වානක යන

අයගේ සහෝදරයා යැයි සිතිය හැකි පුද්ගලයෙකු සිටි බවත්, එම නිවසේ චානක යන නමින් කිසිවෙකු නොමැති බවට එම පුද්ගලයා නොරිස්සුම් සහගත ලෙස පැවසූ බවත්, එහිදී එම පුද්ගලයාගෙන් ඔහුගේ නම විමසූ බවත්, එවිට "ඔයාට ඕනේ චානක කියලා කෙනෙක් නම් හොයාගන්න, මගේ නමින් වැඩක් නැනේ" යනුවෙන් නොරිස්සුම් සහගත ලෙස පැවසූ බැවින් වැඩිදුර කතා නොකර ආපසු පැමිණි බවත් සඳහන් කර ඇත.

එසේම, 2023.04.13 වන දින පැය 15.40ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 247 සහ ඡේදය 222 යටතේ පො.ප. ගුණරත්න නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව ඉහත කී චානක නැමති සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා 2023.04.13 වන දින පො.ප. ගුණරත්න නිලධාරියා ඇතුලු නිලධාරීන් පිරිසක් 2023.04.13 වන දින පැය 09.30ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 239 සහ ඡේදය 208 යටතේ සටහන් යොදා පිටව ගොස් ඇති බවත්, චානක යන අය සොයා ගිය බවත්, චානක යන අයගේ නිවසට යන විට ඔහුගේ පියා වන රත්නායක රාලලාගේ රංජිත් පද්මකුමාර රත්නායක යන අය නිවසේ සිටි අතර ඔහුගෙන් චානක යන අය සම්බන්ධයෙන් විමසා සිටි බවත්, එවිට චානක යනුවෙන් ප්‍රදේශයේ කිහිපදෙනෙකු සිටින බැවින් නිවැරදි නම විමසන ලෙස එම පුද්ගලයා දන්වා සිටි නමුත්, චානක ලෙස නම යෙදෙන තම පුතෙක් සිටින බවත්, ඔහු දැනට රත්නපුර ප්‍රදේශයේ රැකියාවක් කරන බවත් පවසා සිටි බවත්, කෙසේවෙතත් ඔහුගේ විස්තර ලබා දිම ප්‍රතික්ෂේප කරන ලද බවත්, පසුව නිවස ද පරීක්ෂා කළ නමුත්, සැකකරු නිවසේ නොසිටි බවත් සඳහන් කර ඇත.

තවද, 2023.04.19 වන දින පැය 16.07ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 07 සහ ඡේදය 325 යටතේ පො.ප. ගුණරත්න නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව 2023.04.19 වන දින පො.ප. ගුණරත්න නිලධාරියා ඇතුලු නිලධාරීන් පිරිසක් 2023.04.19 වන දින පැය 09.10ට කෑගල්ල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 398 සහ ඡේදය 318 යටතේ යටතේ සටහන් යොදා පිටව ගොස් ඇති බවත්, එහිදී චානක යන අය සම්බන්ධයෙන් සොයා බැලූ නමුත්, ඔහු සිටින ස්ථානයක් සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකි වූ බවත් සඳහන් කර ඇත.

එසේම, 2023.04.26 වන දින පැය 07.00ට කෑගල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 139 සහ ඡේදය 159 යටතේ පො.ප. ඇතුගල නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව 2023.04.26 වන දින පො.ප. ඇතුගල නිලධාරියා ඇතුලු නිලධාරීන් පිරිසක් 2023.04.26 වන දින පැය 04.20ට කෑගල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 139 සහ ඡේදය 158 යටතේ යටතේ සටහන් යොදා පිටව ගොස් ඇති බවත්, එම්.ඕ.ආර් 192/23 ට අදාල යට්ටොගොඩ චානක යන අය සොයා යන ලද බවත්, ලද තොරතුර අනුව එම නිවසට ගිය බවත්, නිවසේ හිමිකරු හා තවත් පුද්ගලයෙකු නිවසේ සිට අතර, චානක නැමති පුද්ගලයෙකු නොමැති බව පැවසූ බවත් සටහන් කර ඇත.

එසේම, 2023.04.29 වන දින පැය 22.20ට කෑගල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 200 සහ ඡේදය 467 යටතේ පො.ප. ගුණරත්න නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව 2023.04.29 වන දින පො.ප. ගුණරත්න නිලධාරියා ඇතුලු නිලධාරීන් පිරිසක් 2023.04.29 වන දින පැය 12.15ට කෑගල්ල පොලිස් ස්ථානයේ කොට්ඨාශ අපරාධ විමර්ශන අංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 191 සහ ඡේදය 463 යටතේ යටතේ සටහන් යොදා පිටව ගොස් ඇති බවත්, සැකකාර වානක යන අය සොයා ඔහුගේ නිවසට ගිය අතර මුලින් වානක කියා අයෙකු නොමැති බවට එහි සිටි පිරිමියෙකු හා කාන්තාවක පවසා සිටි බවත්, පසුව පො.ප. ගුණරත්න නිලධාරියා විසින් සැකකරුගේ මංගල ඡායාරූපයක් පෙන්වූ පසු එම ඡායාරූපයේ සිටින්නේ තම පුතා බවට එකී පිරිමි තැනැත්තා හා කාන්තාව පිළිගත් බවත්, දැනට මාසයක පමණ කාලයක සිට තම පුතා නිවසට නොපැමිණි බවත් රත්නපුර ප්‍රදේශයේ රැකියාවක් කරන බවත් පවසා සිටි අතර ඒ සම්බන්ධව ප්‍රකාශයක් ලබා ගැනීමට සූදානම් වුවත් දෙදෙනාම ප්‍රකාශ ලබා දීමට නොහැකි බව ප්‍රකාශ කළ බවත්, එම දෙදෙනාගේ නම සටහන් කර ගැනීමට ජාතික හැඳුනුම්පත් ඉල්ලා සිටි අවස්ථාවේදී ජාතික හැඳුනුම්පත් නොමැති බවද පවසා සිටි බවත්, ඔවුන් මෙම සැකකරු සම්බන්ධව තොරතුරු හිතාමතා වසන් කරන බවට අනාවරණය වූ බවත් සටහන් කර ඇත.

ඒ අනුව කෑගල්ල පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ රුක්මන් වනිගසේකර යන අයට පහරදීමේ පැමිණිල්ලට අදාළ සැකකරු වන “වානක” නැමති පුද්ගලයා සිටින ස්ථානය සොයා ගැනීම සඳහා 2023.04.09, 2023.04.13, 2023.04.19, 2023.04.26 සහ 2023.04.29 යන දින වලදී කෑගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශන කටයුතු සිදු කර ඇති නමුත්, සොයා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

2023.06.27 වන දින පැය 13.45ට කෑගල්ල අපරාධ විමර්ශන කාර්යාංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 422 සහ ඡේදය 18 යටතේ ප්‍ර.පො.ප. නාලක නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව එම්.ඕ.ආර්.192/23හි සැකකරු වන රත්නායක රාලලාගේ කාංචන සාලිය රත්නායක (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ 1 වන පැමිණිලිකරු) නොහොත් වානක යන අය 2023.06.25 වන දින පැය 19.50ට පහරදීම, අයුතු ඇතුළුවීම යන වරද කියා දී අත්අඩංගුවටගත් බව සඳහන් කර ඇත. මෙම අත්අඩංගුවට ගැනීම සඳහා 1 සිට 9 දක්වා වන වගඋත්තරකාර නිලධාරීන් සියලු දෙනා සහභාගී වී ඇති බව ඉහත කී සටහන අනුව නිරීක්ෂණය වේ. එසේම, 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය 2023.06.25 වන දින පැය 20.30ට පොලිස් නිලධාරීන්ට පහරදීම සහ පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම යන වරද කියා දී අත්අඩංගුවට ගත් බවද ප්‍ර.පො.ප. නාලක නිලධාරියා විසින් ඉහත කී සටහනෙහි සඳහන් කර ඇත.

කෙසේවෙතත් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ තම නමෙහි “වානක” යනුවෙන් නමක් නොමැති බවයි. 2023.06.27 වන දින පැය 13.40ට කෑගල්ල අපරාධ විමර්ශන කාර්යාංශයේ තොරතුරු සටහන් පොතේ පිටුව 28 සහ ඡේදය 425 යටතේ උ.පො.ප. තෙන්නකෝන් නිලධාරියා විසින් යොදා ඇති සටහන අනුව 1 වන

පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව, පහරදීමට අදාළව පොලිස් ස්ථානයට ලැබී තිබූ පැමිණිල්ලෙහි පැමිණිලිකරු වන රුක්මන් වනිගසේකර යන අයගෙන් 2023.06.25 වන දින පැය 23.30ට ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත. එහිදී රුක්මන් වනිගසේකර යන අය ප්‍රකාශ කර ඇත්තේ 2023.03.20 වන දින තම හෝටලයට පැමිණ තමා හට පහරදෙන ලද්දේ පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇති 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය බවත්, මෙම පුද්ගලයාගේ නම චානක ලෙස තමා පැමිණිලි කරන අවස්ථාවේ දී ප්‍රකාශ කළ අතර, ඔහුගේ නම ආර්.ආර්. කාංචන සාලිය රත්නායක බව පසුව දැනගත් බවත් ය.

මේ අනුව පොලිස් ස්ථානය වෙත පහරදීමේ පැමිණිල්ල ඉදිරිපත් කළ තැනැත්තා විසින් එසේ පහර දුන්නේ 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය බවට තහවුරු කර ඇති බවත්, ඔහු විසින් මුලදී චානක යනුවෙන් හඳුන්වා දෙන ලද්දේ එකී 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයම බව ද තහවුරු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුගේ නිවසෙහි ඥාති පිරිසක් සමඟ සාදයක් පවත්වමින් සිට ඇති අතර, එම ස්ථානයට පොලිස් නිලධාරීන් ඇතුළු වී අත්අඩංගුවට ගැනීමට උත්සහ කිරීමේ දී දෙපාර්ශවය අතර ගැටුමක් ඇති වී ඇති බවත්, එහිදී පැමිණිලි පාර්ශවයට මෙන්ම වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ට ද තුවාල වී ඇති බවත් දෙපාර්ශවයේ ප්‍රකාශ වලින් නිරීක්ෂණය වේ.

අංක එම්.ඕ.ආර්. 192/23 දරණ පැමිණිල්ලට අදාළව අත්අඩංගුවටගත් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය නඩු අංක බී/5218/23 යටතේ ද, අත්අඩංගුවට ගැනීමට යාමේදී පහර දී පොලිස් නිලධාරියෙකුට තුවාල සිදු කිරීම හා රාජකාරියට බාධා කිරීම යන වරදට අදාළව 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය සහ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය නඩු අංක බී 5528/23 යටතේ ද කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය සහ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය ප්‍රකාශ කර ඇත්තේ පොලිස් නිලධාරීන් විසින් පහර දීම හේතුවෙන් කෑගල්ල ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබාගත් බවයි.

1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයගේ අංක 144/2023 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව කෑගල්ල ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරිය විසින් 2023.06.26 වන දින ප.ව.1.55ට 1 වන පැමිණිලිකරුව පරීක්ෂා කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ "රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය" යටතේ 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය ලබාදෙන ලද රෝගී ඉතිහාසය පහත පරිදි සටහන් කර ඇත.

"ඊයේ රෑ (2023.06.25) අපේ පවුලේ කට්ටියයි වයිෆ්ගේ පවුලේ කට්ටියයි එකට අපේ ගෙදර පාටියක් තිබුණා. රෑ 8.45ට විතර සිවිල් ඇඳුම් පිටින් කට්ටියක් පිටිපස දොර ඇරගෙන ගේ ඇතුළට ආවා. අම්මයි වයිෆුයි අනික් කට්ටියයි කෑ ගැසුවා. එක පාරටම මගේ අතින් ඇද්දා. මම ඇහුවා කවුද කියලා. එයාලා කිව්වා අපි පොලිසියෙන් කියලා. මම ඇහුවා පොලිසියෙන් නම් මොනවා සම්බන්ධයෙන් ද කියලා. එයාලා මොකුත් කීවේ නෑ. මාව ඇදගෙන එළියට අරන් ආවා. මගේ ඇගේ පුද්ගලයන් 6ක් 7ක් විතර එල්ලුනා. පසුව "මම HQI" කියලා කියාගෙන එක්කෙනෙක් ආවා. ඒ කෙනා සහ තව නිලධාරීන් කිහිප දෙනෙක් මගේ බෙල්ල මිරිකුවා. කකුල් වලින් ඇඟට ගැහුවා. පිටිපසින් කිහිප දෙනෙක් ගෙන් දණහිස් වලින් කොන්දට වැදුනා. මම කීවා මම එන්නම් කලබල කරන්න එපා කියලා. පසුව මගේ වයිෆ් කාන්තා පොලිස් නිලධාරිනියක්වත් නොමැතිව මගේ පියාත් සමඟ ජීප් එකට දා ගත්තා. අපි ඇහුවා මොකක්ද පැමිණිල්ල කියලා. කවුරුවත් අපිට අද උදේ වනතුරු ඒ ගැන කිවුවේ නෑ. පසුව මට අද උදේ ආරංචි වුනා මාත් සමග අමනාප වෙනත් කාන්තාවක් දාපු පැමිණිල්ලක් මත මෙලෙස අපව පොලීසියට රැගෙන ආපු බව. මාව ජීප් එකට දා ගත්තේ හරියට ඇඳුමක්වත් නැතිව. එයින් මා දැඩි අපහසුතාවයකට පත් වුණා. ඔවුන්ගේ පහරදීම් වලින් මගේ අත් දෙක, වම් කකුල, කොන්ද සහ බෙල්ල තුවාල වුණා. පසුව දා (2023.06.26) දහවල් අපිව කෑගල්ල පොලිස් නිලධාරීන් විසින් කෑගල්ල රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරා."

1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව C1 කොටසේ "තුවාල" යටතේ සඳහන් වන්නේ,

01. Multiple scratch abrasions (healing), sizes 1mm - 3mm, placed over the front aspect of the right shoulder region & upper 1/3rd of the right arm.
02. Multiple scratch abrasions (healing) sizes 1mm - 2mm, placed over the front aspect of the lower 1/3rd of the right forearm & right-hand posterior aspect.
03. Contusion over the left forearm lower 1/3rd posterior aspect.
04. Tenderness over the spine, middle & lower back region.
05. Tenderness over the front & back side of the neck.
06. Tenderness over the left arm upper 1/3rd region.
07. Tenderness over the left thigh upper 1/3rd region.
08. Swelling and tenderness of right ankle joint and foot, යනුවෙනි.

තවද, ඉහත කී තුවාල බරපතළ නොවන තුවාල වන බවත්, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය විසින් පහරදීමකට අදාළව ලබා දී ඇති ඉතිහාසය හා ගැළපෙන බවත් අධිකරණ වෛද්‍යවරිය සිය මතය ලෙස සඳහන් කර ඇත.

එසේවුවද, 1 සිට 9 දක්වා වන සියලුම වගඋත්තරකාර නිලධාරීන් විසින් ප්‍රකාශ කර ඇත්තේ, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයව අත්අඩංගුවට ගැනීමට යාමේ දී 1 වන පැමිණිලිකරු ඇතුළු පිරිස වගඋත්තරකාර නිලධාරීන් හට පරුෂ වචනයෙන් බනිමින් කලහකාරි ලෙස හැසිරුණු බැවින් වගඋත්තරකාර නිලධාරීන් විසින් අවම බලය යොදා අත්අඩංගුවටගත් බවත්, කිසිදු අවස්ථාවකදී 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයට පහරදීමක් සිදු නොකළ බවත් ය. කෙසේවෙතත් අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයට වගඋත්තරකාර පාර්ශවය විසින් පහරදීමක් සිදු කළ බවට තහවුරු වී ඇත.

2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයගේ අංක 145/2023 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව කෑගල්ල ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරිය විසින් 2023.06.26 වන දින ප.ව.2.30ට 2 වන පැමිණිලිකරුව පරීක්ෂා කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, එකී අධිකරණ වෛද්‍ය වාර්තාවේ "රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය" යටතේ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය ලබාදෙන ලද රෝගී ඉතිහාසය පහත පරිදි සටහන් කර ඇත.

"ඊයේ රෑ (2023.06.25) 7.30ට 8.00ට විතර ගෙදර ෆැමිලි පාටියක් තිබුණා. අපේ ගෙදරට සිවිල් ඇඳුමෙන් කට්ටියක් ඇවිත් අයියාව ඇඳගෙන යන්න හැදුවා. පාර දිගේ අයියාව ඇදගෙන ගියා. 7ක් 8ක් විතර හිටියා. සම්පූර්ණයෙන් 12ක් 13 ක් විතර හිටියා පාර දිගේත් එක්ක. මට එක්කෙනෙක් පහර දුන්නා. කළු ගලකින් දකුණු කකුලට ගැසුවා. පස්සේ මට කිහිප දෙනෙක් පිටට, නලලට, කොන්දට අත් වලින් ගැසුවා. පස්සේ මම වෙන වාහනයක පොලීසියට ආවා. පසුව 9.00ට 10.00ට විතර පොලීසිය ඇතුලෙදි මාවත් ඇරෙස්ට් කරා. මගේ ඔළුවයි. දකුණු කකුලයි, පපුවයි, පිටයි, දකුණු අතයි තුවාල වුණා. පසුව දා දවල් (2023.06.26) කෑගල්ල පොලිස් නිලධාරීන් විසින් අපිව කෑගල්ල මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරා."

2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ C1 කොටසේ "තුවාල" යටතේ සඳහන් වන්නේ,

01. Contusion with tenderness over the left forehead region.
02. Tenderness over the left side of the chest front and lower aspect.
03. Tenderness over the left lower back, loin region.

04. Healing linear abrasion, (scab forming) 1cm in size, placed over the dorsal &lateral aspect of the right foot, 5cm below the right anklet joint.
05. Swelling and tenderness of right foot, 4th &5th toes.
06. Healing abrasion 2cm in size, linear in shape placed over the right hand dorsal (back) aspect with swelling and tenderness of the surrounding area, යනුවෙනි.

තවද, ඉහත කී තුවාල බරපතළ නොවන තුවාල වන බවත්, 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය විසින් පහරදීමකට අදාළව ලබා දී ඇති ඉතිහාසය හා ගැළපෙන බවත් අධිකරණ වෛද්‍යවරිය සිය මතය ලෙස සඳහන් කර ඇත.

එසේම, වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශයන් වල සඳහන් වන්නේ 1 වන පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී නිලධාරීන් තිදෙනෙක් හැරුණු විට අනෙක් සියලු දෙනා සිවිල් ඇඳුමින් පිටව ගිය බවයි. 8 වන වගඋත්තරකාර පො.කො.රි.80972 සෝමරත්න යන නිලධාරියාගේ ප්‍රකාශයේ සඳහන් වනුයේ 8 වන වගඋත්තරකාර පො.කො.රි.80972 සෝමරත්න, 4 වන වගඋත්තරකාර පො.සැ.59561 බණ්ඩාර සහ 7 වන වගඋත්තරකාර පො.සැ.රි.34544 අබේරත්න යන අයවලුන් නිල ඇඳුමින් සැරසී සිටි බවත්, 1 වන වගඋත්තරකාර ප්‍ර.පො.ප. මාගෙදරගම මහතා සහ අනෙකුත් වගඋත්තරකාර නිලධාරීන් සිවිල් ඇඳුමින් සිටි බවත් ය.

වගඋත්තරකාර පාර්ශවය විසින් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී වීඩියෝගත කරන ලද සීඩී තැටියක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව දෙපාර්ශවය අතර යම් ගැටුමක් ඇති වී ඇති බවත්, අත්අඩංගුවට ගැනීමේ දී නිලධාරීන් විසින් යම් බලයක් පාවිච්චි කර ඇති බවත් නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලිකාර පාර්ශවය විසින් ද පරුෂ වචන කියමින් ආවේගශීලීව හැසිරෙන බවද නිරීක්ෂණය වේ. එසේ ආවේගශීලීව හැසිරීම සම්බන්ධයෙන් පැමිණිලිකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, පොලිස් නිලධාරීන් මුල් අවස්ථාවේදී සිවිල් ඇඳුමින් සැරසී පිටුපස දොර කඩාගෙන ඇතුළු වී ආවේගශීලීව හැසිරීම නිසා තමන් බියට පත් වූ බැවින් එලෙස හැසිරුණු බවයි.

<u>නිගමනය</u>

ශ්‍රී ලංකාවේ බලාත්මක නීතියට අනුව පොලිස් නිලධාරීන් විසින් යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඇතුළත්ව ඇත්තේ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත තුළ ය. යම් සංඥෙය වරදකට අදාළව වරෙන්තුවක් නොමැතිව යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගත යුත්තේ ඇත්තේ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 වගන්තිය ප්‍රකාරව ය. 32(1)(ආ) වගන්තිය අනුව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තෙකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේද නැත්හොත් ඒ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම්

තැනැත්තෙකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තෙකු අත්අඩංගුවට ගත හැකි ය.

ඉහත සඳහන් කරුණු අනුව රුක්මන් වනිගසේකර යන අයට යට්ටෝගොඩ පදිංචි චානක යන අය විසින් පහරදුන් බවට කෑගල්ල පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ලට අදාළව කෑගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් දින කිහිපයකදී අදාළ ප්‍රදේශයට ගොස් විමර්ශන සිදු කර ඇති අතර, එක් අවස්ථාවකදී සැකකරුගේ ඡායාරූපයක් ද පෙන්වා ඔහුගේ නිවැසියන් වෙතින් තොරතුරු ලබාගෙන ඇති බවට සඳහන් කර ඇති බැවින් ද, තමාට පහරදුන් චානක යනුවෙන් මුල් පැමිණිල්ලේ සඳහන් කළ තැනැත්තා, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය බව ඉහත කී රුක්මන් වනිගසේකර යන අය විසින් තහවුරු කර ඇති බැවින් ද, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය අත්අඩංගුවට ගැනීම සඳහා වගඋත්තරකාර පාර්ශවය වෙත ඔහුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබූ බව තහවුරු වේ. එසේහෙයින් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය අත්අඩංගුවට ගැනීම නීතියට අනුකූලව සිදු කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම් සහ සීඩී තැටිය අනුව පැමිණිලිකාර පාර්ශවය ද ආවේගශීලීව හැසිරී ඇති බව නිරීක්ෂණය වන බැවින් පැමිණිලිකාර පාර්ශවය විසින් වගඋත්තරකාර පාර්ශවයේ රාජකාරියට බාධා කළ බවට වන ප්‍රකාශය බැහැර කළ නොහැකි ය. එහෙත් වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති පරිදි නිශ්චිතවම 9 වන වගඋත්තරකාර පො.සැ.64324 සම්පත් නිලධාරියාගේ රාජකාරියට 1 වන සහ 2 වන පැමිණිලිකරුවන් බාධා කළ බවට තහවුරු වන හෝ එය බැහැර කළ හැකි සාක්ෂියක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්ව නොමැත. කෙසේවෙතත් ඊට අදාළව කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ මේ වන විට නඩුවක් විභාග වන බැවින් ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව මේ අවස්ථාවේදී තීරණයක් ලබා දීමට අදහස් නොකරයි.

තවද, පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම් සහ වීඩියෝ සාක්ෂි අනුව සලකා බැලීමේ දී ඉහත කී 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයව අත්අඩංගුවට ගැනීම සඳහා වගඋත්තරකාර නිලධාරීන් ඔහුගේ නිවසට ගිය අවස්ථාවේ දී දෙපාර්ශවය අතර ගැටුම්කාරී තත්ත්වයක් ඇති වී තිබෙන බව පෙනී යයි. පැමිණිලිකාර පාර්ශවය විසින් අසභ්‍ය වචන කියමින් වගඋත්තරකාර පාර්ශවය වෙත දෝෂාරෝපණය කරන බව එකී වීඩියෝ දර්ශන අනුව පෙනී යයි. 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය සහ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය ඇතුළු නිවසේ සිටි පිරිස 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයව අත්අඩංගුවට ගැනීම සඳහා බාධා කරමින් ප්‍රතිරෝධය පෑම හේතුවෙන් අවම බලය භාවිත කර අත්අඩංගුවට ගැනීමට සිදු වූ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත. එම අවස්ථාවේ දී දෙපාර්ශවය අතර ඇති වූ කලහකාරී තත්ත්වය හේතුවෙන් පැමිණිලිකරුවන්ට තුවාල සිදු වන්නට ඇති බවට ද වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ

කර ඇත. එහිදී 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය විසින් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය අත්අඩංගුවට ගැනීමට වගඋත්තරකාර පාර්ශවයට බාධා කරමින් කලහකාරී ලෙස හැසිරුණු බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කළ ද, එම අවස්ථාවේ දී 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය අත්අඩංගුවට ගැනීමට සඳහා වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේම, 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය වගඋත්තරකාර පාර්ශවය පැමිණි වාහන පිටුපසින් පොලිස් ස්ථානය වෙත ගොස් ඇති බවත්, එහිදී පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම මත අත්අඩංගුවට ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අය, වගඋත්තරකාර පාර්ශවය විසින් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය රැගෙන යන අවස්ථාවේ දී ඔවුන් පසුපස පොලිස් ස්ථානය වෙතම පැමිණීම තුළින් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය අත්අඩංගුවට ගැනීමට අදාළව ඔහුගේ පාර්ශවයෙන් ප්‍රතිරෝධයක් එල්ල වූ බවට වන වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශය පිළිගත හැකි බව පෙනී යයි.

එසේවුවද, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අය ගේ සහ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයගේ පිළිවෙළින් අංක 144/2023 සහ 145/2023 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවන්ට අනුව ඔවුන්ගේ ශරීරයේ පවතින තුවාල, ඔවුන් හට වගඋත්තරකාර නිලධාරීන් විසින් පහරදුන් බවට ලබා දී ඇති රෝග ඉතිහාසය හා ගැළපෙන බවට අධිකරණ වෛද්‍යවරිය විසින් සඳහන් කර ඇත. එසේම, යාපා මුදියන්සේලාගේ පසිඳු දිල්ශාන් බණ්ඩාර යන අය විසින් 2025.02.11 දිනැති දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එහි සඳහන් කර ඇත්තේ, යාපා මුදියන්සේලාගේ පසිඳු දිල්ශාන් බණ්ඩාර යන අය 2023.06.25 වන දින රාත්‍රී 8ට පමණ යට්ටෝගොඩ දම්රජ විහාරයට හැරෙන හන්දියේ සිටියදී ඒ ආසන්නයේ පොලිස් ජීප් රථයක් නවත්වා තිබූ බවත්, එකී ස්ථානයේ ගම්වැසියන් පිරිසක් ද සිටි බවත්, එම අවස්ථාවේදී නිල ඇඳුමින් සහ සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් පිරිසක් විසින් 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයව බෙල්ලෙන් අල්ලාගෙන මීටර් 50ක පමණ දුරක් අමානුෂික ලෙස පස්සෙන් පස්සට ඇදගෙන ගොස් පොලිස් රථයට නංවාගත් බව තමා දුටු බවත් ය.

එලෙස වෛද්‍ය සාක්ෂි සහ ඇසින් දුටු සාක්ෂියක් පවතින බැවින් ද, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමේ දී ප්‍රතිරෝධය පෑම නිසා අත්අඩංගුවට ගැනීම සඳහා අවම බලය භාවිත කිරීමට සිදු වූ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති බැවින් ද, 1 වන පැමිණිලිකාර ආර්.ආර්. කාංචන සාලිය රත්නායක යන අයගේ සහ 2 වන පැමිණිලිකාර ආර්.ආර්. ප්‍රමෝද් උදාර රත්නායක යන අයගේ ශරීරයන්හි පැවති බවට අධිකරණ වෛද්‍ය වාර්තාවන්වල සඳහන් තුවාල වගඋත්තරකාර පාර්ශවය විසින් ඔවුන් හට පහරදීමෙන් ඇති වූ ඒවා ද නැතහොත් පැමිණිලිකරුවන්ගේ ප්‍රතිරෝධය හමුවේ අවම බලය භාවිත කිරීමෙන් ඇති වූ ඒවා ද යන්න සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පැන නැඟී ඇත.

තවද, පැමිණිලිකාර පාර්ශවය විසින් අධිකරණ වෛද්‍යවරිය වෙත ලබා දී ඇති රෝගී ඉතිහාසයන් සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු අනුව ඔවුන් හට වගඋත්තරකාර නිලධාරීන් විසින් අදාළ පහරදීම් සිදු කර ඇත්තේ අත්අඩංගුවට ගැනීම සඳහා ඔවුන්ගේ නිවස වෙත පැමිණි අවස්ථාවේදී ය. 8 වන වගඋත්තරකාර පො.කො.රි. 80972 සෝමරත්න නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, තමා අදාළ අත්අඩංගුවට ගැනීම සඳහා සහභාගී වුවද, තමා පැමිණිලිකරුවන්ගේ නිවස වෙත නොගොස් නිලධාරීන් එම ස්ථානයට ගිය ත්‍රීරෝද රථයේ ආරක්ෂාව සඳහා මාර්ගයේ නැවතී සිටි බවයි. 7 වන වගඋත්තරකාර පො.සැ.රි. 34544 අබේරත්න නිලධාරියා විසින් ද කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, 8 වන වගඋත්තරකාර පො.කො.රි. 80972 සෝමරත්න නිලධාරියා මාර්ගයේ රඳවා ගිය බවයි. ඒ අනුව 8 වන වගඋත්තරකාර පො.කො.රි. 80972 සෝමරත්න නිලධාරියා පැමිණිලිකරුවන්ගේ නිවස වෙත ගොස් නොමැති බැවින් එම නිලධාරියා, පැමිණිලිකරුවන් හට වගඋත්තරකාර පාර්ශවය විසින් නිවසේදී සිදු කරන ලද පහරදීම් සඳහා සම්බන්ධ වී නොමැති බව තහවුරු වේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

1 වන වගඋත්තරකාර ප්‍ර.පො.ප. පී.එන්.බී. මාගෙදරගම, 2 වන වගඋත්තරකාර පො.ප. ආර්.කේ. රූපසිංහ, 3 වන වගඋත්තරකාර පො.කො.10419 රෝහණ, 4 වන වගඋත්තරකාර පො.සැ.59561 බණ්ඩාර, 5 වන වගඋත්තරකාර පො.කො.84239 ප්‍රේමසිරි, 6 වන වගඋත්තරකාර පො.කො.85049 හේමචන්ද්‍ර, 7 වන වගඋත්තරකාර පො.සැ.රි.34544 අබේරත්න සහ 9 වන වගඋත්තරකාර පො.සැ.64324 සම්පත් යන නිලධාරීන් විසින් මෙම සිදුවීමේ දී ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව සහ පැමිණිලිකරුවන් හට සිදු වී ඇති තුවාල, වගඋත්තරකාර පාර්ශවය විසින් චේතනාන්විතව පහර දීමෙන් ඇති වූ ඒවා ද නැතහොත් පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමේ දී ප්‍රතිරෝධය පෑම නිසා ඒ අනුව බලය භාවිත කිරීමෙන් ඇති වූ ඒවා ද යන්න පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 06. 30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව



පිටපත් අනෙක් පිටුවෙහි ඇත.

පිටපත්-: 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය ,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය